SRI LANKA

histories that connect

සබැඳි ඉතිහාසය

இணைந்த வரலாறுகள்

# රංගකලාව ඇසුරෙන් ඉතිහාසය ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රමවේද




COLLECTIVE FOR HISTORICAL DIALOGUE & MEMORY

EuroClio Inspiring History and Citizenship Educators

SCOPE Strengthening Social Cohesion and Peace in Sri Lanka

Co-funded by the European Union

german cooperation DEUTSCHE ZUSAMMENARBEIT

Implemented by: giz Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH

# Acknowledgements

**Authors**

Pujitha De Mel, Chathura Vimarsha Fernando, Sanjaya Heattarachi and Tharanga Gunasekara of the Shaili Foundation

**Published by**

EuroClio - European Association of History Educators as part of the project *Histories that Connect Sri Lanka II*

**Copyright**

CC BY 4.0

**To cite this publication:**

De Mel, P., Fernando, C. V., Heattarachi, S. & Gunasekara, T. (2025). Learning & Teaching History with Theatre. *EuroClio - European Association of History Educators.*

**Supported by**

*This publication was supported by the Strengthening Social Cohesion and Peace in Sri Lanka (SCOPE) programme. SCOPE is co-funded by the European Union and the German Federal Foreign Office and implemented by GIZ in partnership with the Government of Sri Lanka. The content of the publication does not represent the official position of the European Union, the German Federal Foreign Office, GIZ, or the Government of Sri Lanka.*

# පටුන

1) හැඳින්වීම

2) මෙම පොත භාවිතා කිරීම සඳහා අපගේ මාර්ගෝපදේශය

3) ඉතිහාසය ඉගැන්වීමේ  සහ ඉගෙනීමේ ක්‍රියාවලිය සඳහා රංග ක්‍රීඩා

Theatre games for learning “History“

a. පළමු රංග ක්‍රීඩාව

b. දෙවන රංග ක්‍රීඩාව

c. තෙවන රංග ක්‍රීඩාව

d. සිව්වන රංග ක්‍රීඩාව

e. පස්වන රංග ක්‍රීඩාව

4) සමාලෝචනය

# 1. හැඳින්වීම

## a. දැනුමයි - විනෝදයයි... නව්‍ය ඉගෙනුම් රටාවක්!

නාට්‍යය යනු කුමක්ද? අධ්‍යාපනය යනු කුමක්ද? මුලදී මෙය ඉතා සරල ප්‍රශ්නයක් ලෙස ගම්‍ය වේ. නමුත් පිළිතුර බොහෝ විට ව්‍යාකූල වනු ඇත. නාට්‍යවේදීන් හෝ අධ්‍යාපනඥයන් බොහෝ දෙනෙකු මේ සඳහා විවිධ නිර්වචන ලබාදී තිබේ. ඒ සියලු නිර්වචනයන් තුළින් එකිනෙක හා බැඳුණු අන්තර් සම්බන්ධතාවයන් දිස් වෙයි.

සාමාන්‍යයෙන් නාට්‍ය යන වචනය අපට ඇසෙන විට අපේ මනසෙහි ක්ෂණිකවම මැවෙන්නේ ප්‍රේක්ෂකයන් ඉදිරියේ එක් පුද්ගලයකු හෝ පුද්ගල සමූහයක් විසින් විනෝදාස්වාදය සහ ඥානාලෝකය සඳහා කරනු ලබන නිර්මාණාත්මක රංග රටා පෙළකි. අධ්‍යාපනය ගැන සාකච්ඡා කරන විට, අපේ සිතුවිලි තුළින් මතුවන්නේ පන්තිකාමරයක් තුළ ක්‍රියාත්මක වන සම්ප්‍රදායික පාසල් අධ්‍යාපන ක්‍රම රටාවකි.

අවසානයේ නිර්වචනයන් කෙසේ වුවත් හරයාත්මකව අධ්‍යාපනය සහ නාට්‍යය යන ක්ෂේත්‍රයේ පුද්ගලයන් සහ ප්‍රජාවන් හැඩගැස්වීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම විෂය ක්ෂේත්‍රයන් ද්විත්වයම පුද්ගල වර්ධනයට සහ සමාජ සංවර්ධනයට එකසේ දායක වේ.

රංග කලාව තුළින් අධ්‍යාපනය (TIE) හෝ රංග කලා විනෝදාස්වාදය තුළින් අධ්‍යාපනය (THEATRE EDUTAINMENT) යන සංකල්පය මුසුවීම තුළින් සම්මත පන්ති කාමරයෙන් ඔබ්බට කුතුහලය සහ විචාරශීලි චින්තනය, උත්තේජනය, නිර්මාණශීලීත්වය සහ සාමූහිකත්වය වර්ධනය වන අධ්‍යාපනික වපසරියක් සිසුන් තුළින්ම ගොඩනැගෙනු ඇත.

මෙවන් ඉගෙනුම් ක්‍රමයක් තුළින් විශේෂයෙන්ම සිසු ප්‍රජාවන් තුළ කණ්ඩායම් සාකච්ඡා, භූමිකා රංගන දැක්වීම්, සහයෝගීතා ක්‍රියාකාරකම්, විවිධ දෘෂ්ටිකෝණයන් ගවේෂණය කිරීමට සහ ඔවුන්ගේම අර්ථකථනයන් වර්ධනය කිරීමට අවකාශයක් නිර්මාණය වේ.

අධික වේගයෙන් දිව යන වර්තමානයේ සිසුන්ගේ අවධානය තම විෂයට යොමු කරවීම සඳහා නිර්මාණශීලී -නව්‍යාත්මක ඉගෙනුම් ප්‍රවේශයක් වන ඉහත සඳහන් නාට්‍ය ආශ්‍රිත අධ්‍යාපන සංකල්පයන් [(TIE) & (TE)] තුළින් නිසි අවකාශය සැලසේ. ඒ මගින් ඉලක්කගත පාර්ශ්වයන් තුළ කුතුහලය සහ පරිකල්පනය වර්ධනය කරයි. මෙම නාට්‍ය ආශ්‍රිත අධ්‍යාපන සංකල්පයන් තුළින් ගම්‍ය වන ප්‍රධාන ශක්‍යතාවයක් වන්නේ සංකීර්ණ ගැටලු වලට මුහුණදීමටත්, එයට විකල්ප ප්‍රවේශයන් සොයාගැනීම හා භාවිතාවට යෙදවීමටත් අවස්ථාවන් ලබාදීමයි. තවද ආකර්ෂණීය කථා අනුසාරයෙන් විෂය නිර්දේශයන් තුළින් මතුවන ගැටලු සාකච්ඡා කිරීමට අවශ්‍ය අවකාශයන් නිර්මාණය වේ. මෙමගින් පුද්ගල හා සමාජයේ සංවර්ධනය සඳහා සෘජු මැදිහත්වීමක් සිදුවේ.

## b. කවුරුන් සඳහාද?

මෙම පොත් පිංච මූලිකව ඉලක්කගත වන්නේ ගුරුවරුන්ටයි. ඉතිහාසය විෂයක් වශයෙන් සිසුන් සඳහා උගන්වනු ලබන ගුරුවරුන්ට නව්‍ය ඉගෙනුම් ක්‍රම රටාවන් ලෙසට මෙහි සඳහන් ක්‍රමවේදය යොදාගත හැකිය. සංකීර්ණ පාඩමක් වුවද ඉතා රසවත් අයුරින් සිසු සිසුවියන්ගේ සහභාගිත්වයෙන් නාට්‍ය ආශ්‍රිත අධ්‍යාපන සංකල්පයන් [(TIE) & (TE)] භාවිත කරමින් වඩාත් විනෝදාත්මකව හා විචාරාත්මක ආකාරයට අධ්‍යයන අභ්‍යාසවල යෙදීමේ ශක්‍යතාවයන් මෙම නාට්‍ය ආශ්‍රිත අධ්‍යාපන සංකල්පයන් තුළින් මතුවේ.

### C. ඉතිහාසය වැදගත් වන්නේ ඇයි?

අපේ ලෝකයේ මූලාරම්භය සහ සංකීර්ණතා අවබෝධ කරගැනීම සඳහා ඉතිහාසය ඉතා වැදගත් වේ. එය අපේ වර්තමානය ස්ථාපිත කර ඇති විවිධ සංස්කෘතීන්,සමාජයන් පිළිබඳව අවබෝධයක් සහ අධ්‍යනයක් ලබාදෙයි. ඉතිහාසය අධ්‍යයනය කිරීම තුළින් විවේචනාත්මක චින්තනය වර්ධනය වන අතර සාක්ෂි ඇගයීමට සහ අපගේ අයිතිවාසිකම්, වගකීම් අවබෝධ කර ගැනීමට අවකාශය සැකසෙනු ඇත. අවසාන වශයෙන් මෙම අධ්‍යයනයන් හරහා සැමට වඩා හොඳ අනාගතයන් හැඩගස්වා ගැනීමට ඉතිහාසය තුළින් අපගේ දැනුම හා කුසලතා වර්ධනය කරයි.

## 2. මෙම පොත භාවිතා කිරීම සඳහා අපගේ මාර්ගෝපදේශය

### අපි මෙය ගුරුවරුන්ට සහ සිසුන්ට ඉතා සරල සහ විනෝදජනක ලෙස නිර්මාණය කර ඇති

1. පාඩම කොටස් වලට වෙන්කර ඇත
අපි ගුරු මාර්ගෝපදේශ අත්පොත අනුගමනය කරමින් තෝරාගත් ආදර්ශ පාඩම කොටස් වලට වෙන්කර ඇත. සෑම අංශයක්ම රංග ක්‍රීඩාවකට සම්බන්ධ වේ.

2. ඔබේ ක්‍රීඩාව සහ පරිසරය තෝරා ගන්න
ගුරුවරුන්ට සහ සිසුන්ට තමන් ක්‍රීඩා කිරීමට අවශ්‍ය කුමන ක්‍රීඩාවද, එම ක්‍රීඩාව ගෘහස්ථ හෝ එළිමහන් පරිසරයකට කැමතිද යන්න තීරණය කළ හැකිය.

3. උපදෙස් අනුගමනය කරන්න
“ක්‍රීඩා” කොටසේ, ඒ ඒ ක්‍රීඩාව සිසුන් සමඟ ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න පිළිබඳ පැහැදිලි උපදෙස් ඔබට ලබා දී ඇත.

4. ක්‍රීඩාවේ ආරම්භය
පළමු පියවර ලෙස, සෑම කෙනෙකුටම සෙල්ලම් කිරීමට සහ ක්‍රීඩාව සමග නිදහසේ හැසිරෙන්නට සලස්වන්න.

5. පාඩම් සමඟ ක්‍රීඩා
දෙවන පියවරේදී, ඔබට පාඩම සමඟ ක්‍රීඩාව බාධාවකින් තොරව මිශ්‍ර කළ හැකිය. ඔබ උගන්වන සංකල්ප ශක්තිමත් කිරීම සඳහා විනෝදජනක සහ අන්තර් ක්‍රියාකාරී ක්‍රමයන් භාවිතා කරන්න.

එබැවින්, ඔබෙත්, ඔබගේ සිසුන්ගෙත් නිර්මාණශීලිත්වය මුදා හැරීමට සහ ඔබේ සිසුන් සමඟ රංග ලෝකය ගවේෂණය කිරීමට අපූරු කාලයක් උදාවනු ඇත.ඉතිහාසය විෂය තුළ හමුවන නිදහසින් පසු ශ්‍රී ලංකාව යන කොටස මෙම පොතේ ආදර්ශ පාඩම ලෙස ගෙන ඇත. එහිදී 1948න් පසු ලංකාවේ ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයන් මුලික කරගෙන මෙම පාඩම ගොඩනැගී ඇත. 1948 දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයෙන් නිදහස ලබා ගත්තේය. කෙසේ වෙතත් ප්‍රශ්නය පැන නගින්නේ මෙය සැබැවින්ම ස්වාධීනත්වයද? ජාතිය ස්වෛරීභාවය

කඩදාසි මත නැවත ලබාගත් අතර යථාර්ථය වඩාත් සංකීර්ණ වේ. අපේ නිදහස යටත් විජිතවාදයේ උරුමයන්, සමාජ-ආර්ථික ව්‍යුහයන්, සංස්කෘතික සම්මතයන් සහ දේශපාලන ගතිකත්වයන් මත හැඩගස්වා ගනිමින් විවිධ ස්වරූපවලින් ස්ථාපිත වී ඇත.

මෙම පාඩම තුළින් ශ්‍රී ලංකා ඉතිහාසයේ සන්දර්භය තුළ නිදහස යන සංකල්පය ගැන විවේචනාත්මකව සිතීමට ගුරුවරුන් සහ සිසුන් පෙළඹවීම අපගේ අරමුණයි. මතුපිට ආඛ්‍යානවලින් ඔබ්බට ගොස් පුද්ගල ජීවිත සහ සාමූහික අනන්‍යතාවය මත ස්වාධීනත්වය බහුවිධ ඇඟවුම් පරීක්ෂා කිරීමට අපි ඔවුන්ව දිරිමත් කරමු. විවේචනාත්මක චින්තන කුසලතා පෝෂණය කිරීමට සහ විකල්ප ප්‍රවේශයන් ගැන සිසුන් දිරිගැන්වීමට අප බලාපොරොත්තුවෙයි. මේ සඳහා මාර්ගෝපදේශයක් ලෙස අදාළ ක්‍රීඩාව සඳහා පාදක වූ කොටස අදාල සාකච්ඡාවට බඳුන් කළ යුතු විශේෂ කරුණු අවසානයට එකතු කර අට.

අප යොදාගත් පාඩමට සමගාමීව නාට්‍ය ක්‍රියාකාරකම් නිර්මාණය කර ඇත.මෙම ක්‍රියාකාරකම් පංතිභාර ගුරුතුමා/ගුරුතුමියගේ මගපෙන්වීම සහ සහභාගීත්වය යටතේ සිදුවිය යුතුය.විෂය කාල පරිච්ඡේදයට මුල් කර ගනිමින් මෙම නාට්‍ය ක්‍රියාකාරකම් නිර්මාණය වී තිබේ.මෙහි ඇතුළත් වී ඇති විවිධ නාට්‍ය ක්‍රියාකාරකම් ඔබට කැමති ආකාරයෙන් අදාළ වෙනත් පාඩම් සඳහා යොදාගත හැකි අතර අවස්ථානුකූලව ඔබට අවැසි අයුරින් වෙනස් කිරීමට අවකාශය ඇත.

# 3. ඉතිහාසය ඉගැනීම සඳහා රංග ක්‍රීඩා
# Theatre games for learning 'History'

## a. පළමු ක්‍රීඩාව - ළිඳ සහ මුරකරු
## (බලය සහ නායකත්වය - 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව)

### හැඳින්වීම

කතන්දරයක් පදනම් කරගත් නාට්‍ය ක්‍රීඩාවකි. මෙය ආරම්භ කිරීමට පෙර පහත සඳහන් කතාව පිළිබඳව ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කරන්න. කතාවේ සඳහන් චරිත තෝරාගැන්මට පංතියේ ශිෂ්‍යන්ට ඉඩ දෙන්න. තවද කතාවේ සඳහන් ආකාරයට අවකාශය සකස් කරගන්න ශිෂ්‍යයන්ව යොමු කරවන්න. එම අවකාශයේ 'ළිඳී ලෙස සංකේතවත් වන ආකාරයට රවුමක් ඇඳගන්න. ඒ තුළ, ක්‍රීඩා කරන ශිෂ්‍යයින්ට අයත් වතුර බෝතල් තබාගන්න.ජලය ලබාගැනීම යනු එම රවුම තුළ ඇති බෝතල් ලබාගැනීමයි

### පසුබිම් කතාව

එක් කුඩා ගමක් ඇත. එම ගමේ මිනිස්සුන්ට භාවිතා කළ හැකි වතුර ඇත්තේ එක් ළිඳක පමණි. එම ළිඳ මුරකරුවකු විසින් ආරක්ෂා කරනු ලබයි. ගම්වාසීන්ට ජලය ලබා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් ඇත. මෙම ළිඤෙන් ජලය ලබා ගත හැක්කේ මුරකරු සහ බල්ලන් දෙදෙනා නිදා සිටින විටදී පමණි.මුරකරුට හෝ බල්ලන් දෙදෙනාට ඇහැරුනහොත් ජලය ලබා ගැනීමට වත්තට ඇතුළු වූ ගම්වාසීන් මුරකරුගේ අත්අඩංගුවට පත්වනු ඇත. එසේම මුරකරු හෝ බල්ලන්ට හසුවීමෙන් ආරක්ෂා වීමට ගම්වාසින්ට නොසෙල්වී සිටීමෙන් හැකිය. නිශ්චිත කාලය අවසානයේ දී ගම්වාසින් විසින් ජලය රැගෙන යා යුතු ය.

මෙම ක්‍රීඩාව කොටස් දෙකකින් සමන්විතය.

## පළමු කොටස

### අවකාශය සකස්කර ගැනීම

1. ක්‍රීඩාව සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීම (පන්ති කාමරයක් තුළ හෝ පිටත)
2. ළිඳක් සංකේතවත් වන අයුරින් රවුමක් සකස් කරගන්න.
3. එම රවුම මත පන්තියේ ළමුන්ගේ වතුර බෝතල් තබන්න.
4. එම ළිඳ සලකුණු කරගත් ස්ථානයකට තරමක් දුරින් වැටක් ලෙසට හැඟවන පරිදි ලණුවක් අදින්න.
5. එම ලණුව සෙලවෙන කොට ශබ්දය නැගෙන පරිදි ගෙජ්ජි හෝ හිස්ටින් හෝ එවැනි උපකරණ එල්ලන්න.

### ක්‍රීඩාව සිදුකිරීමට උපදෙස්

1. පන්තියේ ළමුන් අතුරින් එක් ළමයෙක් මුරකරුවකු ලෙසත් දෙදෙනෙක් ආරක්ෂක බල්ලන් ලෙසත් තෝරාගන්න. සෙසු පිරිස් ගම්වාසීන් වේ.
2. මුරකරු සහ බල්ලන් නිදා සිටින අවස්ථාවේ ගම්වාසින් කිහිපදෙනෙකු වතුර ලබා ගැනීම සඳහා වත්තට ඇතුල් වේ.
3. ගම්වාසීන් වත්තට ඇතුළු වන අවස්ථාවේ හරහට බැද ඇති ලණුවේ ගැටී ශබ්දයක් මතුවුවහොත් බල්ලන් ඇහැරේ.
4. ඉන්පසුව බල්ලන් බිරූ පසු මුරකරුට අවදි විය හැක.
5. ඒ මොහොතේ වත්තට ඇතුළු වී සිටින ගම්වාසින් කිසිදු චලනයක් නොකර ගල්ගැසී සිටීමෙන් බල්ලන්ට සහ මුරකරුට හසු නොවී සිටීමට හැකියාවක් ඇත.
6. වත්තට ඇතුළු වූ ගම්වාසීන් කොතෙකුත් උත්සාහ කළත් ළිදෙන් වතුර ලබාගෙන පිටතට පැමිණීමට හැකියාවක් නැත.
7. මේ සඳහා ලැබෙන්නේ විනාඩි දහයක් පමණි.

මෙම ක්‍රීඩාවේ පළමු කොටස මෙතැනින් අවසන් වේ. මෙතැන් සිට ක්‍රීඩාවේ දෙවෙනි කොටස ආරම්භ වේ.

1. මෙහිදී ගුරුවරයාගේ මැදිහත් වීම සිදුවේ.
2. මුරකරු සහ බල්ලන් ක්‍රීඩාවෙන් ඉවත් වී ළිඳේ අයිතිය ගුරුවරයාට බාර දෙයි.
   මෙහිදී මුරකරු හා බල්ලන්ට හිමිවී තිබූ ළිඳේ අයිතිය මහජනතාවට (අනෙක් සෙසු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට) පැවරීම සඳහා ගුරුවරයා මැදිහත් වේ.
3. ගමට වතුර ලබාගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයන් යෝජනා ඉදිරිපත් කරන ලෙස ගුරුවරයා ගම්වාසීන්ට දැනුම් දෙන අතර එම යෝජනා ඉදිරිපත් කරන්නන් නායකයන් ලෙස පත්කිරීම සිදු කරයි.
4. එම නායකයන්ට සලකුණක් හා නමක් තීරණය කිරීම (පක්ෂ වැනි) සිදු කළ යුතු ය.
5. එම නායකයන්ට සහය වීමට කැමති අය එම කණ්ඩායම් වලට එකතු වීමට ඉඩ සැලැස්වීම.
6. එක් එක් නායකයන් හට අනෙකුත් කණ්ඩායම්වල සාමාජිකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ඔවුන්ගේ යෝජනා පිළිබඳ ගම්වැසියන් දැනුවත් කිරීමට අවස්ථාව සලසා දීම
   (මේ සඳහා යම් නියමිත කාල සීමාවක් එම නායකයන්ට ලබා දිය යුතු ය.)
7. ඡන්ද විමසීමකින් පසුව බහුතරය විසින් තෝරන කණ්ඩායමේ යෝජනාව මත ළිඳෙන් වතුර ගැනීම සිදුකිරීමට එම කණ්ඩායමට හා නායකයාට බාර දීම.
8. යලිත් වසරක කාලයක් ගෙවී ගිය බව ගුරුවරයා පවසා, යලි මෙම කොටස සිදු කිරීම එහිදී අවශ්‍ය පරිදි නායකයන් වෙනස් වීම හෝ කණ්ඩායම් එකතු වීම නව නායකයන් පත් වීම සිදු විය හැක.

## අවශ්‍ය කරන අමුද්‍රව්‍ය

බ්‍රිසිල් බෝඩ්, කතුරක්, පාට පැන්සල් හෝ ප්ලැටිග්නම්, කඹයක් ,ගෙජ්ජි , ටින් ආදී ශබ්දය නැගෙන උපකරණ

## සාකච්ඡාව තුළ මතු කරන ප්‍රශ්න.

1 ක්‍රීඩාවෙන් දැනුණු දේ විග්‍රහ කිරීම.

2. ක්‍රීඩාව ආශ්‍රයෙන් ලබාගත් ප්‍රධාන කරුණු පෙළගැස්වීම. (නායකත්වය, බලය, දේශපාලන පක්ෂ , ඡන්දය)

3. සංවිධාන ගතවීමේ අවශ්‍යතාවය කුමක්ද යන්න පැහැදිලි කිරීම.

4. අනෙකුත් කණ්ඩායම් ගැන තමන්ට හැඟුණු දේ කුමක්ද යන්න පැහැදිලි කිරීම.

5. 1947සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇසුරෙන් සාකච්ඡාව මතු කිරීම.


මෙම රංග ක්‍රීඩාව සුදුසු වෙනස්කම් සිදුකරමින් ඔබට වෙනත් පාඩමක් ඉගැන්වීමේ දී ද භාවිතා කළ හැක. උදාහරණයක් ලෙස අනුරාධපුර රාජධානිය පාඩම සඳහා භාවිතා කළ හැක.




පළමු ක්‍රීඩාවේ බිම් සැලැස්ම figure 01



ගම් වැසියන් වතුර ගැනීම සඳහා උත්සහා කරන අවස්ථාවක් (පළමු ක්‍රීඩාව) figure 03



ලිඳ සහ වතුර බෝතල් තබා ඇති අවස්ථාව (පළමු ක්‍රීඩාව) figure 02

<table>
<tr><td colspan="2">1947සෝල්බරි ප්‍රතිසංස්කරණ හා නිදහස ලැබීම (Soulbury -Independence-Parliamentary Democracy) යන කොටසට අදාළව සාකච්ඡාවට බඳුන් කළ හැකි කරුණු සඳහා මෙම වගුව මාර්ගෝපදේශයක් කරගන්න</td></tr>
<tr><td>Content අන්තර්ගතයන්</td><td>Critical reading points to discuss සාකච්ඡාවට බඳුන් කළ යුතු සුවිශේෂී විචාරාත්මක කරුණු</td></tr>
<tr><td>Independence<br>නිදහස</td><td>What is Independence?<br>නිදහස යනු කුමක්ද ?<br><br>National Anthem of Sri Lanka?<br>ජාතික ගීය</td></tr>
<tr><td>Solubury Reforms and First Elections<br>1947සෝල්බරි ප්‍රතිසංස්කරණ සහ පළමු මැතිවරණය</td><td>Election and establishment of political parties<br>මැතිවරණය සහ දේශපාලන පක්ෂයන් ස්ථාපිත වීම.<br><br>Why in a country need political parties?<br>රටකට දේශපාලන පක්ෂ අවශ්‍ය ඇයි ?<br>Why do we need an election?<br>මැතිවරණයක් අවශ්‍ය ඇයි ?<br><br>What were the political parties formed in SL during the colonial period and after independence?<br>යටත් විජිත සමයේ සහ නිදහසින් පසුව ඇතිවූ දේශපාලන පක්ෂ මොනවා ද?<br><br>LSSP- Lanka Sama Samaja Party ලංකා සම සමාජ පක්ෂය<br>UNP- United National Party එක්සත් ජාතික පක්ෂය<br>Tamil Congress දෙමළ කොංග්‍රසය<br>Lanka Indian Congre ලංකා ඉන්දීය කොංග්‍රසය<br>Bolshevik Lenin Party බෝල්ෂෙවික් ලෙනින් පක්ෂය<br>Lanka Communist Party ලංකා කොමියුනිස් පක්ෂය<br>Labour Party කම්කරු පක්ෂය<br>Independence Candidate ස්වාධීන අපේක්ෂකයන්<br><br>Indian Estate Workers<br>ඉන්දියානු වතු කම්කරුවෝ<br><br>Colonial Influence යටත්විජිත බලපෑම<br>Origin" Rights and Issues<br>ආරම්භය , අයිතීන් සහ බලපෑම්</td></tr>
</table>

## b. දෙවන ක්‍රීඩාව

### 1953 හර්තාල්

### හැඳින්වීම

මෙම ක්‍රීඩාවේ පසුබිම කතාව පදනම් වී ඇත්තේ 1953 දී ශ්‍රී ලංකාවේ සිදු වූ හර්තාලය නැතහොත් "මහජන කැලඹීම" (අරගලය) ආශ්‍රිතවයි.මෙහි අරමුණ විසම්මුතික අදහස් තුළින් සම්මුතික තත්ත්වයන් ගොඩනැගීම මුල් කරගත් ප්‍රායෝගික නාට්‍ය ක්‍රියාකාරකමකි.

### අවශ්‍ය කරන අමුද්‍රව්‍ය

වළල්ලක් සහ පෑන්


### ක්‍රීඩාව සිදුකිරීමට උපදෙස්

1. මෙම ක්‍රීඩාව සඳහා මෙහෙයවන්නෙකු සිටිය යුතු යි.
2. පන්තියේ ළමුන් 15 තෝරාගෙන රහසිගතව ඔවුන්ට 1-15 දක්වා අංක ලබාගැනීමට මෙහෙයවන්න.
3. ඔවුන්ට රවුමක් සේ සිට එකිනෙකාට එක්පසකට තම මුව මත රදවා ගත් පෑනක් භාවිතයෙන් වළල්ලක් හුවමාරු කිරීමට සලස්වන්න.
   (මේ සඳහා වළල්ලක් හෝ වෙනත් සුදුසු උපකරණයක් භාවිතා කළ හැක.)
4. ක්‍රීඩාව මෙහෙයවන්නා
   (මෙම පහළොවට අයත් නොවන ඉතිරි ළමුන් හෝ මෙහෙයවන ගුරුවරයා විය හැක)
   තමන් කැමති අංක හතරක් නම් කරයි.
5. එම නම් කිරීම සමඟ එම අංක හතර හිමි ක්‍රීඩකයන් ප්‍රධාන රවුමෙන් ඉවත්වේ.
6. එවිට පවත්වාගෙන ගිය ක්‍රීඩාව නවතී.
7. ඉවත් වූ කණ්ඩායම සාකච්ඡා කොට දැනට රවුමේ සිටින අංක අතුරින් එක අංකයක් නම් කොට තම ඉල්ලීම ඉටු කරන ලෙසට පවසයි.
8. එම ඉල්ලීම නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් හෝ ඉදිරිපත් කිරීමක් හෝ විය හැක.
9. එම ඉල්ලීම ඉටු කල පසු රවුමෙන් ඉවත් වූ ක්‍රීඩකයන් යළි රවුමට එකතු විය යුතු ය.
10. එම ඉල්ලීම ඉටු කිරීමට නොහැකි වුවහොත් තම ඉල්ලිම ඉටුකරගැනීමට වෙනත් අංකයක් යෝජනා කිරීමට රවුමෙන් ඉවත් වූ අයට හැකි ය.

### සාකච්ඡාව තුළ මතු කරන ප්‍රශ්න


1. විවිධ ඉල්ලීම් ඉටු කරගැනීම සඳහා සිදු කළ හැකි මහජන ප්‍රවේශයන් මොනවා ද ?
2. හර්තාල් ක්‍රියාවලියක් මගින් බලපෑම් කළ හැකි ආකාරය කුමක්ද යන්න සාකච්ඡා කිරීම.
3. හර්තාලය යන වචනයේ ඓතිහාසික පදනම පැහදිලි කරන්න.
4. 1953 හර්තාලය පැහැදිලි කිරීම.

මෙම රංග ක්‍රීඩාව සුදුසු වෙනස්කම් සිදුකරමින් ඔබට වෙනත් පාඩමක් ඉගැන්වීමේ දී ද භාවිතා කළ හැක. උදාහරණයක් ලෙස ප්‍රංශ විප්ලවය , ඇමරිකානු විප්ලවය යන පාඩම් සඳහා භාවිතා කළ හැක. එසේම පාඩමක පුනරීක්ෂණයක් සඳහා ද මෙම ක්‍රීඩාව භාවිතා කළ හැක.




දෙවන ක්‍රීඩාව බිම් සැලැස්ම

(ක්‍රීඩකයන් රවුමෙන් ඉවත් වීමට පෙර) figure 4a




දෙවන ක්‍රීඩාව බිම් සැලැස්ම

(ක්‍රීඩකයන් රවුමෙන් ඉවත් වීමෙන් පසු) figure 4b

| 1953 හර්තාලය (1956 මැතිවරණට පෙර-Before 1956 Reforms) යන කොටසට අදාළව සාකච්ඡාවට බඳුන් කළ හැකි කරුණු සඳහා මෙම වගුව මාර්ගෝපදේශයක් කරගන්න. | |
|---|---|
| **Content අන්තර්ගතයන්** | **Critical reading points to discuss සාකච්ඡාවට බඳුන් කළ යුතු සුවිශේෂී විචාරාත්මක කරුණු** |
| Before 1956<br>1956 පෙර | Harthal 1953<br>1953 හර්තාල්<br><br>What harthal means?<br>හර්තාල් යනු කුමක් ද ?<br><br>Why?<br>ඇයි ?<br><br>හර්තාල් , උද්ඝෝෂණ , විප්ලව සහ සමාජ නැගිටීම් හරහා සමාජයට සිදුවන බලපෑම කෙබදුද ?<br><br>The influence of the people uprisings, revolutions,protests and harthals |

## C. තෙවන ක්‍රීඩාව - පහේ සෙල්ලම (1956 පංච මහා බලවේගය)

### හැඳින්වීම

මෙම ක්‍රීඩාව Image Theater (රූප රංග රටා) ඇසුරින් පදනම් වූවකි. 1956 ආරම්භ වූ පංච මහා බලවේගය මුල් කරගෙන මෙම නාට්‍ය ක්‍රියාකාරකම් නිර්මාණය වී ඇත. පන්තියේ සිටින ළමුන් කණ්ඩායම් හයකට බෙදී යන පරිදි කණ්ඩායම්ගත කර පංච මහා බලවේගය පිළිබඳ කරනු ලබන ක්‍රීඩාවකි. මේ සඳහා පංච මහා බලවේගය නිරූපණය වන එක් එක් රූප සහිත කාඩ් පත් භාවිතා කරනු ලබයි.

### අමුද්‍රව්‍ය

බ්‍රිසිල් බෝඩ්, කාඩ්බෝඩ් පෙට්ටියක්, පින්සල්, තීන්ත, කතුරු

### ක්‍රීඩාව සිදුකිරීමට උපදෙස්

1. මෙම ක්‍රීඩාව මෙහෙයවීම ගුරුවරයා විසින් සිදු කරනු ලැබිය යුතුය .
2. පංච මහා බලවේගයේ එක් එක් බලවේගය පිළිබඳව වන සංකේත ඇතුළත් අඟල්3x3 ප්‍රමාණයේ කාඩ්පත් සකස් කරගන්න. සංකේත පහට අමතර කණ්ඩායම සඳහා අඟල් 3x3 ප්‍රමාණයේ සංකේත කිසිවක් නොමැති කාඩ්පත් සකස් කරගන්න.
3. මෙම සංකේත පහකින් යුත් කාඩ් සහ සංකේත කිසිවක් නොමැති කාඩ්පත් සකස් කිරීමේදී පන්තියේ සිටින ළමුන් සමානව කණ්ඩායම් හයකට බෙදෙන ආකාරයෙන් කාඩ්පත් සංඛ්‍යාව තීරණය කරන්න.
4. ළමුන් සමානව නොබෙදෙන්නේ නම් ඉතිරි වන ළමුන් සංඛ්‍යාව සංකේත පහට අයත් කණ්ඩායම් වලට අයත් නොවන කණ්ඩායමට යොමු කළ හැක..
5. මෙම සියලුම කාඩ් පත් බාහිරින් ඇතුළත නොපෙනෙන පෙට්ටියක හෝ බෑගයක දමා එක් කාඩ්පත බැගින් පන්තියේ සිටින සෑම ළමයෙකුටම ලබා ගන්නා ලෙස දැනුම් දෙන්න.
6. ළමුන් ලබාගත් සංකේතවලට අනුව කණ්ඩායම් ගතවන ලෙස දැනුම් දෙන්න.
7. තම කණ්ඩායමට ලැබී ඇති සංකේතය දැක්වෙන වෘත්තිය සේවය පිළිබිඹු වන පරිදි කණ්ඩායමේ සියලුම සාමාජිකයන් එක්වී පිළිමයක් ලෙස නිශ්චල ආකාරයේ පවතින අවස්ථාවක් නිරූපණය කර පෙන්වන ලෙස දැනුම් දෙන්න.
8. එක් එක් කණ්ඩායම විසින් සකස් කරනු ලබන නිශ්චල පිළිම සකස් කිරීම සඳහා වෙන් වෙන්ව කණ්ඩායම සඳහා වේලාවන් ලබාදෙන්න.
9. එක් එක් කණ්ඩායම් විසින් නිර්මාණය කරන පිළිම අනෙකුත් කණ්ඩායම් වලට නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.
10. සමස්ත ක්‍රියාකාරකම අවසානයේ මෙම ක්‍රියාකාරකම පිලිබදව සහ පංචමහා බලවේගය පිලිබද සාකච්ඡාව සඳහා අවස්ථාව ලබා දෙන්න.

### සාකච්ඡාව තුළ මතු කරන ප්‍රශ්න


1. අංක 5 හි වැදගත්කම කුමක්ද ? (පංචසීල, පස් පවු, පස්මහබැළුම්, පංච නීවර්ණ, පස්වග මහණුන්, පංච මහද්වීප, පංච මහාවිල්, පංච මහා වාදය)
2. මේ ලෙස පංච මහාබලවේගයක් සකස්කලේ ඇයි.?
3. පංච මහාබලවේගයේ බලපෑම රටට කෙබදුද?

4. රට ඉදිරියට ගෙනයන නෛතික රාමුව හැඳුවෙ පංචමහා බලවේගයද? රට ගොඩනගන්න පංච මහාබලවේගය මැදිහත් උනාද?
5. 1956 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නැගීම.
6. පංච මහා බලවේග තුළ ඇති එකිනෙකට වන වෙනස්කම් මොනවාද? සහ 1956 මැතිරවණයට ඒ හරහා ඇති වූ බලපෑම කුමක්ද ?
7. ඇයි සඟ විතරක් ගත්තෙ ? අනිත් පූජකවරු මෙයට ඇතුලත් නොවුනෙ ඇයි.?


මෙම රංග ක්‍රීඩාව සුදුසු වෙනස්කම් සිදුකරමින් ඔබට වෙනත් පාඩමක් ඉගැන්වීමේ දී ද භාවිතා කළ හැක.



Image Theater (රූප රංග රටා) figure 05




තෙවන ක්‍රීඩාව බිම් සැලැස්ම figure 06



තෙවන ක්‍රීඩාව සඳහා අවශ්‍ය කාඩ්පත් සඳහා ආදර්ශයක් figure 07



තෙවන ක්‍රීඩාව සඳහා වෙද භූමිකාව නිරූපණය කරමින්
figure 08



තෙවන ක්‍රීඩාව සඳහා ගොවි භූමිකාව
නිරූපණය කරමින් figure 09

සාකච්ඡාවට බඳුන් කළ යුතු සුවිශේෂී විචාරාත්මක කරුණු
Critical reading points and topics of the lesson

1956 මැතිවරණ හා සමාජ පෙරළිය (1956 Reforms, Social transform)

| **Content අන්තර්ගතයන්** | **Critical reading points to discuss සාකච්ඡාවට බඳුන් කළ යුතු සුවිශේෂී විචාරාත්මක කරුණු** |
|---|---|
| Before 1956<br>1956 පෙර | Harthal 1953<br>1953 හර්තාල්<br><br>What harthal means?<br>හර්තාල් යනු කුමක් ද ?<br><br>Why?<br>ඇයි ? |
| 1956 Election<br>1956 මැතිවරණය | Pancha maha balawegaya<br>political propaganda<br>පංච මහා බලවේගය සහ දේශපාලන ව්‍යාපාරය (ප්‍රොපගැන්ඩාව)<br>+<br>Formation SLFP<br>ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිර්මාණය කිරීම<br><br>1956 election (results and changes)<br>1956 මැතිවරණය ප්‍රතිපල සහ ඉන් ඇතිවූ වෙනස්වීම්<br><br>Sinhala as the official language<br>සිංහල භාෂාව රාජ්‍ය භාෂාව ලෙස<br><br>Public sector booming<br>Port and transport<br>රාජ්‍ය අංශය වර්ධනය වීම<br>වරාය සහ ප්‍රවාහන |

## d. සිව්වන ක්‍රීඩාව - රෑකඩ නැටවීම (1972)

### හැඳින්වීම

පන්තියේ සිටින ළමුන් දෙදෙනා බැගින් කණ්ඩායම් ගත වන රෙදි පටි දෙකක් සහ සංගීත ඛණ්ඩයක් සමග සිදුකරනු ලබන රිද්මයානුකූල ක්‍රීඩාවකි.

### අමුද්‍රව්‍ය

1. රෙදි පටි දෙකක්
2. පසුබිම් සංගීතයක්
3. සංගීතය වාදනය කිරීමට අදාල උපකරණ


### උපදෙස්

1. පන්තියේ ළමුන් දෙදෙනා බැගින් වන පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
2. එක් කණ්ඩායමක සිටින ළමුන් දෙදෙනාගෙන් එක් අයෙක් A ලෙසද අනෙක් අය B ලෙසද නම් කරන්න.
3. සෑම කණ්ඩායමකටම අඩි තුනක් පමණ දිග වන රෙදි පටි දෙක බැගින් ලබාදෙන්න.
4. B ලෙස නම් කරගත් දරුවාගේ දෑතේ මැණික් කටුවේ රෙදිපටි දෙකේ එක් කෙළවරක් ගැටගසන්න.
5. රෙදි පටි දෙකේ අනෙක් කෙළවර A ලෙස නම් කරගත් දරුවාගේ අත් දෙකෙන් අල්ලා ගන්නා ලෙස දැනුම් දෙන්න.
6. පන්තියේ සිටින කණ්ඩායම් ගණන අනුව පන්තියේ බිම අයෙකුට හිටගෙන සිටිය හැකි වන පරිදි කොටුවක් හෝ රවුමක් ඇඳගන්න.
7. මෙම කොටු හෝ රවුම් දෙකක් අතර පරතරය අඩි හයක් වත් විය යුතුය.
8. සෑම කණ්ඩායමකම B ලෙස හැඳින්වූ ළමයා කොටුව හෝ රවුම තුළ තබන්න.
9. වාදනය කරනු ලබන සංගීතයට අනුව A විසින් B ව රෙදි පටි දෙක ආධාරයෙන් හසුරවන ලෙස දැනුම් දෙන්න.
10. මෙහිදී ඊට කොටුව හෝ රවුම තුළින් පිටතට යා නොහැකි බව දැනුම් දෙන්න.
11. මද වේලාවකින් Bගේ එක් අතක රෙදි පටිය අතහරින ලෙස A ට දැනුම් දෙන්න.
12. Aගේ අනෙක් අතෙහි වන රෙදි පටියෙන් Bව තවදුරටත් සංගීතයට අනුව හසුරුවන ලෙස දැනුම් දෙන්න.
13. මද වේලාවකින් එම රෙදි පටියද අත හරින ලෙස උපදෙස් දෙන්න.
14. Bට කැමති ආකාරයට සංගීතයට අනුව නිදහසේ චලනය වන ලෙස උපදෙස් දෙන්න.
15. මෙම ක්‍රීඩාව නැවත වරක් A හා Bගෙ ස්ථානයන් මාරු කර (A ගේ අත් දෙකේ රෙදි පටි ගැටගසා) කරන ලෙස දැනුම් දෙන්න.
16. රෙදි පටි වෙනුවට අඩි තුනක් පමණ දිග කෝටු දෙකක්ද මෙම ක්‍රීඩාව සඳහා භාවිතා කළ හැකිය.
17. පන්තියේ ළමුන්ගේ කණ්ඩායම් ප්‍රමාණයට අනුව පන්ති කාමරය ඉඩකඩ සීමා සහිත නම් මෙම ක්‍රීඩාව අවස්ථා දෙකකදී හෝ කිහිපයකදී කළ හැකිය.

**සාකච්ඡාව තුළ මතු කරන ප්‍රශ්න**

1. Aට දැනුනු දේ කුමක්ද යන්න සාකච්ඡා කරන්න.
2. Bට දැනුනු දේ කුමක්ද යන්න සාකච්ඡා කරන්න.
3. නරඹන්නන්ට හැඟුණු දේ කුමක්ද යන්න සාකච්ඡා කරන්න.
4. නිදහස යනු කුමක්ද යන්න සාකච්ඡා කරන්න.
5. ඩොමිනියන් තත්වයේ නිදහස හා සම්පූර්ණ නිදහස ලබා ජනරජයක් වීම යන අවස්ථා දෙකේ වෙනස පැහැදිලි කිරීමට සැලැස්වීම.
6. පීඩනය තුළ ජීවත් වන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න.
7. පීඩනයට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද යන්න සාකච්ඡා කරන්න.
8. 1972 ජනරජ ව්‍යවස්ථාව සහ ජනරජ ව්‍යවස්ථාවේ අඩංගු දේ පිළිබඳ සාකච්ඡා කරන්න.

මෙම රංග ක්‍රීඩාව සුදුසු වෙනස්කම් සිදුකරමින් ඔබට වෙනත් පාඩමක් ඉගැන්වීමේ දී ද භාවිතා කළ හැකි




සිව්වන ක්‍රීඩාව බිම් සැලැස්ම figure 10



සිව්වන ක්‍රීඩාව නිරූපණය කරන අවස්ථාවක්
figure 12



සිව්වන ක්‍රීඩාව ක්‍රීඩා කරන අවස්ථාවක්
figure 11

| |
|---|
| සාකච්ඡාවට බඳුන් කළ යුතු සුවිශේෂී විචාරාත්මක කරුණු<br>Critical reading points and topics of the lesson |
| 1972 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වීම -<br>1972 Janaraja -constitution - Republican state |

| **Content අන්තර්ගතයන්** | **Critical reading points to discuss සාකච්ඡාවට බඳුන් කළ යුතු සුවිශේෂී විචාරාත්මක කරුණු** |
|---|---|
| 1972 constitution<br>1972 ජනරජ ව්‍යවස්ථාව | What does Republican state mean?<br>ජනරජයක් යනු කුමක්ද ?<br><br>Why does SL need a republican state?<br>ශ්‍රී ලංකාවට ජනරජයක් වීමට අවශ්‍ය ඇයි ?<br><br>Establishment of the republican<br>ජනරජය ස්ථාපිත කිරීම<br><br>What SL gained from the 1972 constitution ජනරජ ව්‍යවස්ථාව හරහා ශ්‍රී ලංකාව ලබාගත් දේ මොනවාද |
| | the 1972 constitution<br>structure of the parliament,<br>Nomintive Executive presidency<br>judiciary<br><br>1972 ජනරජ ව්‍යවස්ථාව<br>පාර්ලිමේන්තුවේ ආකෘතිය<br>නාමික විධායක ජනාධිපති<br>අධිකරණය |

## ඉ. පස්වෙනි ක්‍රීඩාව (1978)

කංකංබූරූ සෙල්ලම

"කංකංබූරූ"
"සිං සිං ඥෝරූ"
"මන් කියන දේ අහනවද"
"ඔව් ..."
"එහෙනම් දුවල දුවල ගිහින් ..........."

මෙම සෙල්ලම භාවිත කර විවිධ හැඩ සහ විවිධ ඉරියව් සෑදීම සඳහා ළමුන් මෙහෙයවීම.

### උපදෙස්


1. නායකයා ලෙස එක් අයෙක් තෝරාගන්න.
2. පන්ති කාමරය ඉඩකඩ සහිතව සකස් කරගන්න.
3. අනික් පිරිස ජනතාව ලෙස වෙන් කරගන්න.
4. නායකයා විසින් අනෙක් පිරිස භාවිතා විවිධ හැඩතල සකස්කරවාගන්න. (උදාහරණ ලෙස රවුමක්, ත්‍රිකෝණයක්)
5. නායකයා විසින් ඉන්පසු විවිධ ආගමික හෝ සංස්කෘතික කටයුතු කරවාගන්න. (උදාහරණ ලෙස ගාථාවක්, ගීතයක් කීමට හෝ යාතිකාවක් කීමට සැලැස්වීම)
6. අනතුරුව නායකයා විසින් ඔවුන්ටම නව නායකයෙකු පත් කිරීමට සැලැස්වීම.
7. ඉන්පසු නව නායකයා විවිධ බලපෑම් ඇතුළු දේවල් සඳහා ඔවුන් යොමු කරවාගන්න. (එක අයෙකු රවුමක් මැද දණගැස්සීමට සැලැස්වීම වැනි)
8. අවසානයේ නායකයා විසින් ජනතාව ලවා තමන්ට වැඳීමට සැලැස්වීම.

### අමුද්‍රව්‍ය කිසිවක් අවශ්‍ය නැත

### සාකච්ඡාව තුළ මතු කරන ප්‍රශ්න

1. රවුමක්, සෘජුකෝණාස්‍රයක්, සමචතුරස්‍රයක් සහ ත්‍රිකෝණ වැනි හැඩ තුළ ඇති විශේෂත්වය හෝ ඔවුන්ට දැනුණු දේ ප්‍රශ්න කරන්න.
2. විවධ ආගමික සංස්කෘතික චලනයන් හා ඉරියව් පිළිබඳ ප්‍රශ්න කිරීම.
3. විධායක බලය යනු කුමක්ද යන්න සාකච්ඡා කරන්න
4. 1978 විධායක ජනාධිපතිධුරය පිළිබඳ සාකච්ඡා කරන්න.
5. විධායක බලය ලංකාව තුළ භාවිතා කළ ආකාරය පිළිබඳ අත්දැකීම් බෙදාගන්න.

මෙම රංග ක්‍රීඩාව සුදුසු වෙනස්කම් සිදුකරමින් ඔබට වෙනත් පාඩමක් ඉගැන්වීමේ දී ද භාවිතා කළ හැක. උදාහරණයක් ලෙස යුරෝපා ඉතිහාසය තුළ මධ්‍ය කාලීන යුරෝපයේ රදළ සමාජය, ඊජිප්තු ශිෂ්ටාචාරය වැනි පාඩම් සඳහා අවශ්‍ය වෙනස්කම් සිදුකරමින් මෙය භාවිතා කළ හැක.



පස්වෙනි ක්‍රීඩාව බිම් සැලැස්ම
figure 13



පස්වෙනි ක්‍රීඩාව සිදුකරන අවස්ථාවක්
figure 14



පස්වෙනි ක්‍රීඩාව සිදුකරන අවස්ථාවක්
figure 15

| සාකච්ඡාවට බඳුන් කළ යුතු සුවිශේෂී විචාරාත්මක කරුණු<br>Critical reading points and topics of the lesson | |
|---|---|
| 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 -constitution | |
| **Content අන්තර්ගතයන්** | **Critical reading points to discuss සාකච්ඡාවට බඳුන් කළ යුතු සුවිශේෂී විචාරාත්මක කරුණු** |
| Election<br>මැතිවරණය | Executive presidency<br>විධායක ජානාධිපතිධූරය<br><br>Economical change<br>ආර්ථික විපර්යාසය<br><br>Before 1978 Economical restrictions<br>1978ට පෙර ආර්ථික සම්බාධක<br><br>Open economy<br>විවෘත ආර්ථිකය |
| 1978 constitution<br>1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | Change the name of the country<br>රාජ්‍ය නාමය වෙනස් වීම<br>Democratic Socialist Republican State of Sri Lanka<br>ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමජාදවාදී ජනරජය<br><br>Structure<br>ආකෘතිය<br><br>Economy ආර්ථිකය<br>Executive presidency විධායක ජනාධිපති ධූරය<br>Parliament පාර්ලිමේන්තුව<br>Judiciary අධිකරණය<br><br>Changing the election System<br>මැතිවරණ ක්‍රමය වෙනස්වීම<br><br>මනාප ක්‍රමය<br>Preference voting system |

# 4. සමාලෝචනය

ඉතිහාසය ඉගෙනීම හුදෙක් අතීත සිදුවීම් පිළිබඳ දත්ත අධ්‍යනයක් පමණක් නොව සාර්ථක අනාගතයක් හැඩැස්වීම සඳහා තීරණාත්මක මාර්ගෝපදේශයකි. ඉතිහාසය පුරාවට සිදුවූ සිදුවීම් නැවත නැවතත් සිදුවීමේ රටාව මානව ශිෂ්ටාචාරය තුළ දැකිය හැකි ය. මෙම ඓතිහාසික සිද්ධීන් අධ්‍යනය සහ ඒවා විශ්ලේෂණය කිරීම ඕනෑම ජන සමාජයකට අත්‍යවශ්‍ය සාධක යෙකි. සංස්කෘතික විවිධත්වය, පුරාණ ශිෂ්ටාචාර සහ සංකීර්ණ භූ දේශපාලන ගතිකත්වයන් ඇතුළත් ශ්‍රී ලාංකීය ඉතිහාසය අධ්‍යනය කිරීම හරහා විචාරශීලී දැනුමකින් හෙබි ශිෂ්‍ය ප්‍රජාවක් වර්ධනය කිරීම මෙහි අරමුණයි.

දේශීය පාසල් විෂය සන්දර්භය තුළ ඉතිහාසය ඉගෙනුම් හා ඉගැන්වීම් සඳහා නව ක්‍රමවේදයන් වර්ධනය කිරීමේ අවකාශයක් පවතී. ඒ සඳහා රංග කලාව තුළින් අධ්‍යාපනය (TIE) හෝ රංග කලා විනෝදාස්වාදය තුළින් අධ්‍යාපනය (THEATRE EDUTAINMENT) යන සංකල්පය භාවිතයෙන් නාට්‍ය ක්‍රියාකාරකම් තුළින් ඉතිහාස විෂය ඉගැන්වීම මේ උත්සහයේ අරමුණයි. ඉතිහාසය විෂය සඳහා නිර්දේශ වික් පාඩමක් මේ සඳහා භාවිතා කර ඇත. එසේම පංතිකාමරය තුළ ගුරුවරයා තමන්ට අභිමත පරිදි මෙම ක්‍රමවේදයන් භාවිතයෙන් වෙනත් පාඩම් ද මේ ආකාරයෙන් ඉගැන්විය හැක. ගුරුවරයාගේ සහ සිසුන්ගේ නිර්මාණශීලිත්වය වර්ධනය කරගනිමින් මෙම ක්‍රීඩා සහ රංග කලා ක්‍රියාකාරකම් ආදාල පාඩම සහ මාතෘකාව සඳහා අවැසි ආකාරයෙන් වෙනස් කළ හැකි වන ලෙස නිර්මාණය කර ඇත. එසේම මෙම ක්‍රීඩාවල ආකෘතිය පදනම් කරගනිමින් ගුරුවරුන් වශයෙන් ඔබට රිසි සේ විවිධ වෙනස් පාඩම් සඳහා යොදාගැනීමට හැකියාව ඇත. එසේම සිසුන්ගේ විශ්ලේෂණය සහ තර්ක බුද්ධිය වර්ධනය වීම ද මෙම ක්‍රියාකාරකම් හරහා සිදුවේ. මෙම පොත හරහා අප විසින් බලාපොරොත්තු වුයේ ඉතිහාසය වෙනස් සේම රසවත් ආකාරයකින් ඉගැන්වීම සඳහා මගපෙන්වීම සහ සිසුන්ගේ චින්තන හැකියාව වර්ධනය කිරීම සඳහා සහය වීම ය.